www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධය: එහි දේශපාලන හා පන්ති ප්‍රශ්න

## The war in Sri Lanka: the political and class issues

**ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය**

**2009 මාර්තු 11**

ආන්ඩුව විසින් දෙමල සුලුතරයට එරෙහිව ගෙන යන සාපරාධී යුද්ධය වහා නතර කල යුතු බව ද දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් ආරක්ෂක හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු බව ද සමාජවාදී සමානතා පක්ෂය (සසප) කියා සිටියි. දෙමල ජනතාවට මෙන්ම දිවයිනේ සියලු වැඩ කරන ජනතාවන්ට ද ඉමහත් ව්‍යසනයක් ගෙන දී ඇති 25 වසරක ගැටුමට, ජනාධිපති මහින්ද රාජපක්ෂ හා කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතය ම වගකිව යුතු වෙයි.

දෙමල ඊලම් විමුක්ති කොටි (එලටීටීඊ) සංවිධානයට එරෙහි ආන්ඩුවේ යුද්ධය සනිටුහන් කරන්නේ, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ජීවිත කෙරෙහි ශ්‍රී ලංකාවේ පාලක පැලැන්තිය දක්වන තුච්ඡ ආකල්පයයි. එල්ටීටීඊ යටතේ ඉතිරිව ඇති භූමිභාගයට, හමුදාව ගුවනින් හා ගොඩබිමින් ප්‍රහාර එල්ල කරන්නේ, ජීවත් වීමට අවශ්‍ය මූලික පහසුකම් කිසිවකින් තොරව එහි සිරවී සිටින දෙමල සිවිල් වැසියන්ගේ ඉරනම ගැන කිසිදු තැකීමකින් තොරව ය. සිය ගනනක් මියගොස් තවත් විශාල සංඛ්‍යාවක් තුවාල ලබා ඇත. ඒ අතර වාරයේ, ආර්ථික අගහිඟකම් දඩමීමා කර ගෙන හමුදාවට ගාල්කර ගත් දහස් ගනන් සිංහල තරුනයෝ, එල්ටීටීඊ ආරක්ෂක වැටකඩොලු වෙත එකක් පසුපස තවෙකක් වශයෙන් එල්ල කරන පෙරමුනු ප්‍රහාරක රැල්ලේ ගොදුරු ලෙස පූජා කරනු ලැබ සිටිති.

පෙබරවාරි 4 පැවැත්වූ 61 වන නිදහස් සමරු උලෙලේදී කථාකරමින්, රාජපක්ෂ, උතුර "ත්‍රස්තවාදයෙන් නිදහස් කර ගැනීමෙන්" පසුව "ප්‍රජාතන්ත්‍රවාදයේ නව යුගයක්" උදාකරන බවට පොරොන්දු විය. මේ සෑම වචනයක්ම බොරුවකි. ආන්ඩුව ගෙනයමින් සිටින්නේ ත්‍රස්තවාදයට එරෙහි විමුක්තියේ යුද්ධයක් නොව, දශක ගනනාවක් පුරා ගෙන ගිය දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙතේ ඉහලක් වන දුෂ්ට වාර්ගික යුද්ධයකි. එහි අරමුන ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවා ලීම නොව, සිංහල දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනතාවට එරෙහිව, සිංහල අධිපතිවාදී රාජ්‍යය තහවුරු කර ගැනීම හා සිංහල ප්‍රභූ පැලැන්තියේ වරප්‍රසාද ආරක්ෂා කර ගැනීමයි.

රාජපක්ෂ, වොෂින්ටනය අනුකරනය කරමින් ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල එහි යුද අපරාධවලට පිටුබලය දෙන අතර, ඊට හිලව් වශයෙන් සිය " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" කර ගෙන යෑමට එක්සත් ජනපදයේ සහාය අපේක්ෂා කරයි. තම පාර්ශවයෙන් එක්සත් ජනපදය, එල්ටීටීඊය ට එරෙහිව ආන්ඩුවේ ප්‍රහාරයට සහයෝගය දෙන්නේ, කලාපය තුල සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා සුරක්ෂිත කර ගැනීමේ අරමුනෙනි. මෑතක දී ගාසාවට එල්ල කල ඊස්රායල් ප්‍රහාරය මෙන්ම ශ්‍රී ලංකාව තුල ගැටුම ද පෙන්නුම් කරන්නේ, ගැඹුරු වන ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ මහා බලවතුන්ගේ පසමිතුරුකම් උග්‍රවෙද්දී, අධිරාජ්‍යවාදීන් පුලුල් ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රමවේදයන් කවරේ ද යන්න ය.

ආන්ඩුවේ ආක්‍රමනයෙහි බිහිසුනු ප්‍රතිවිපාක පිලිබඳ දේශපාලන වගකීමෙන් කොටසක් එල්ටීටීඊය මත ද පැවරේ. එය කිසි විටෙකත් කම්කරු පන්තිය වෙත යොමු නොවීය. එහි ක්‍රියාමාර්ගය නියෝජනය කලේ වෙන ම ධනේශ්වර රාජ්‍යයක් පිහිටුවීම මඟින් තමන්ගේ ම වරප්‍රසාද සුරක්ෂිත කර ගැනීමෙහි ලා උත්සුක වූ දෙමල ධනේශ්වරයේ අවශ්‍යතාවන් ය. කොලඹ සංස්ථාපිතයේ සිංහල අධිපතිවාදයෙහි ම පිලිබිඹුවක් වූ දෙමල බෙදුම්වාදී ක්‍රියාමාර්ගය, වාර්ගික බෙදීම් ශක්තිමත් කලේය. දෙමල විරෝධී වෙනස්කම් කිරීමට එරෙහිව වැඩ කරන ජනතාව එක්සත් කිරීම කෙසේ වෙතත් එල්ටීටීඊය "සිංහල ජාතියට" චෝදනා කලේය. සිංහල සිවිල් ජනතාවට එරෙහි එහි ප්‍රචන්ඩ ප්‍රහාර, කෙලින්ම ආන්ඩුවේ අත ශක්තිමත් කල අතර එහි බෙදුම්වාදී ඉදිරිදර්ශනය එල්ටීටීඊයේ වත්මන් දේශපාලන හුදකලාවට මග පෑදීය. මිලිටරිමය බිඳ වැටීමකට මුහුනපා සිටින එල්ටීටීඊය, රාජපක්ෂගේ යුද්ධයට පිටුබලය ලබා දෙන එම මහා බලවතුන් වෙත ම නිෂ්ඵල ආයාචනා නිකුත් කිරීමේ තැනකට පත්ව සිටියි.

එල්ටීටීඊයට එරෙහි හමුදාව අත් කර ගන්නා ජයග්‍රහන, කම්කරු පන්තිය මතට රුදුරු ප්‍රහාර එල්ල කිරීම සඳහා වේදිකාව සකසනු ඇතැයි සසප අනතුරු අඟවා සිටියි. දෙමල ජනතාවට එරෙහි යුද්ධයේ සෑම අදියරක් ම, කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට ද

ජීවන තත්වයන්ට ද පහර එල්ල කිරීම සමග බැඳී පැවතුනි. වැඩ කරන ජනතාව යුද්ධය වෙනුවෙන් කැපකල යුතු යයි රාජපක්ෂ යලි යලිත් බලකර සිටියේය. යුද්ධයට වැය කිරීම සඳහා රට උකසට තබා ඇති ඔහු, දැන් මුහුනපා ඇත්තේ 1930 ගනන්වලින් මෙපිට ඇතිවූ ගැඹුරුම ගෝලීය ආර්ථික පසුබෑමට ය. කම්කරු පන්තියට දැන් එහි බර දැරීමට බල කෙරෙනු ඇත.

සමස්ත දේශපාලන සංස්ථාපිතය ම රාජක්ෂ පිටුපස ගැලතී සිටියි. තත්වාරක්ෂක එක්සත් ජාතික පක්ෂය (එජාප), තමන් එල්ටීටීඊය සමඟ 2002 වසරේ අත්සන් තැබූ සටන් විරාමය ඉවත දමා මිලිටරි ජයග්‍රහන සඳහා ආන්ඩුව වර්නනා කරමින් සිටියි. එපමනක් නොව එජාප නායකයෝ, ඔවුන්ගේ සාම සාකච්ඡා, හමුදාවට යලි සංවිධානය වීමටත් එය යලි ගොඩනැඟීමටත් ඉඩ ප්‍රස්ථාව සැලසූ දක්ෂ උපායක් පමනක් බව කියා සිටිමින් යුද්ධ ජයග්‍රහන සඳහා යම් ප්‍රශංසාවකට හිමිකම් කියා පාති. මේ අතර, සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), යුද්ධය යලි ඇරඹීම කරා රාජපක්ෂ තල්ලුකර ගත්තේ තමන් බවට උදම් අනයි. සටන් විරාමයෙන් පසුව එල්ටීටීඊ හොරනෑව ලෙස ක්‍රියා කල එම දෙමල ජාතික සන්ධානයමත්, දැන් අවස්ථාවාදී ලෙස, එල්ටීටීඊ නායකත්වය වෙතින් ඈත්වෙමින් සිටියි.

එල්ටීටීඊ පරාජයෙන් පසුව සිදුවනු ඇත්තේ කොලඹ සංස්ථාපිතයේ අතිශයින්ම යුදවාදී ස්ථරයන් ශක්තිමත් වීම පමනකි. රාජපක්ෂ තන්ත්‍රය දැනට මත් ක්‍රියාත්මක වන්නේ පාර්ලිමේන්තුව, අධිකරනය හා නීතිය කෙරෙහි තුච්ඡ ආකල්පයකින් යුත් මිලිටරි-දේශපාලන කල්ලියක් ලෙස ය. එල්ටීටීඊ පරාජය හමුවේ හමුදාව අඩුකිරීමේ සූදානම කෙසේ වෙතත්, එය සාමාජිකයන් 150,000 සිට 200,000 දක්වා මහා පරිමානයෙන් පුලුල් කිරීමට ආන්ඩුව නිර්දේශ කර ඇත. "විමුක්ත" කර ගත් උතුරු නැගෙනහිරදී මෙන්ම මුලු මහත් දිවයින ම මහා හමුදා කඳවුරක් බවට පත්කෙරෙමින් තිබේ. රැඳවුම් කඳවුරු හා ඝාතක කල්ලි ද අතුලු රාජ්‍ය මර්දනයේ මෙම පද්ධතිය, සිය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්වයන් රැකගැනීම සඳහා සටන් කරන කම්කරුවන්, ගොවීන් හා තරුනයන්ට එරෙහිව හරවන කාලය වැඩි ඈතක නොවේ.

කම්කරු පන්තියට යුද්ධය අවසන් කල හැක්කේ, ජාතිවාදය හා වර්ගවාදයට එරෙහිව එක්සත් වීම ද පාලක ප්‍රභූවේ සියලු කොටස්වලින් කැඩී වෙන්වීම ද මගින් පමනක් බව සසප අවධාරනය කරයි. හැම පසුබිමකම කම්කරුවන්ට ඇත්තේ පොදු පන්ති සතුරෙකි. ඒ රාජපක්ෂ ආන්ඩුව හා එමගින් ආරක්ෂා කෙරෙන ලාභ පද්ධතියයි. කම්කරුවන් තම ස්ව ශක්තිය මත විශ්වාසය තබමින්, සමාජවාදී ඉදිරිදර්ශනයක පදනම මත කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා අරගලයේ දී, ගම්බද පීඩිත ජනතාව තම පාර්ශවයට දිනාගත යුතුය.

## ඓතිහාසික මූලයෝ

යුද්ධය සමස්ත පරම්පරාවකගේ ම ජීවිත අඳුරේ හෙලා තිබේ. ඓතිහාසික ශේෂපත්‍රයක් සකසා ගැනීමෙන් හා අවශ්‍ය දේශපාලන පාඩම් උකහාගැනීමකින් තොරව, කම්කරු පන්තියට පියවරක් හෝ පෙරට තැබිය නොහැකි ය. අන් සියල්ලටත් වඩා මෙම ඉතිහාසය වනාහි, ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවයේ න්‍යාය පිලිබඳ දීප්තිමත් සනාථනයක් වන්නේය. ධනේශ්වර සංවර්ධනය කල් පසුවූ රටවල ධනපති පන්තිය, මූලික ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් ඉෂ්ට කිරීමෙහි ලා ඓන්ද්‍රීයව ම අපොහොසත් වන බවත්, එබැවින් නිර්ධන පන්තිය ජාත්‍යන්තර සමාජවාදයේ පදනම මත තමන්ගේ ම ක්‍රියාමාර්ගය ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවත් ඒ තුලින් පෙන්වා දෙන ලදී.

යුද්ධය පැන නැගුනේ 1983 වසරේ දී වුවත්, එහි මුල්, දකුනු ආසියාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය අවසන් කිරීම සඳහා ඇති කර ගත් 1947-48 සම්මුතීන් දක්වා ඈතට විහිදෙයි. ඉන්දු උප-මහාද්වීපය පුරා විප්ලවවාදී නැගිටීම් ඇතිවීමේ ඇඟවීම් හමුවේ භීතියට පත්ව සිටි හා එවකදී හිස ඔසවමින් සිටි ධනේශ්වරය, යටත්විජිත විරෝධී ව්‍යාපාරය ගබ්සා කිරීමටත්, කම්කරු පන්තියේ වියදමෙන් සිය අවශ්‍යතා ඉටුකරගත හැකි විසඳුමක් අටවා ගැනීමටත්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග අතිනත් ගෙන වැඩ කලේය. බ්‍රිතාන්‍ය ඉන්දියාව, මුස්ලිම් පකිස්ථානය හා හින්දු අධිපතිවාදී ඉන්දියාව වශයෙන් බෙදා වෙන්කිරීමට තුඩුදුන් මෙම උපමහාද්වීපීය අංග ඡේදනයේ ප්‍රතිඵලය වූයේ, මිලියන ගනන් ජීවිත බිලිගනිමින් මුදාහල, වාර්ගික ප්‍රචන්ඩත්වයේ රැල්ලකි.

ස්වාධීන ශ්‍රී ලංකාවක්, එවකට ලංකාව ලෙස හැඳින්වූ, පිහිටුවීම ද දේශපාලන ගබ්සාවක් විය. බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව සීමාසහිත මහජන විරෝධතාවයක් පනගැන්වූ ඉන්දීය ජාතික කොන්ග්‍රස් නායකයන් සමග සසඳන කල පවා, ශ්‍රී ලංකාවේ නිර්මාතෘන් ඉටුකලේ සුවිශේෂව නිවටවූ භූමිකාවකි. ඉන්දියානු උප-මහාද්වීපය සිසාරා ගිය විප්ලවකාරී මහජන කැලඹීම්, ස්වාධීන රාජ්‍යයක් සඳහා වූ තමන්ගේ ම සැලසුම්වලට හරස් කපනු ඇතැයි බියට පත් දේශීය ධනේශ්වර දේශපාලඥයන්, ලංකාවේ යටත් විජිත විරෝධී ව්‍යාපාරයට සතුරුකම් දැක්වූ අතර ඉල්ලා සිටියේ පූර්න නිදහස නොව, ලංඩනය සමඟ බැඳීම් දිගටම පවත්වා ගන්නා ඩොමීනියන් (කිරීටයට යටත්) තත්වයකි. ඔවුන්ගේ පටු හා ආචීර්න කල්පික අවශ්‍යතාවන්, අස්ථාවර දකුනු ආසියාව තුල සිය

මෙහෙයුම් සඳහා මධ්‍යස්ථානයක් ලෙස ලංකාව පවත්වාගැනීමේ අවශ්‍යතාවෙන් පෙලුනු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ ඕනෑ එපාකම් සමඟ සම්පාත විය.

බ්‍රිතාන්‍යය සතුව පැවති ලංකාවේ, අධිරාජ්‍ය විරෝධී අරගලයෙහි නායකත්වය පැවරුනේ හතරවන ජාත්‍යන්තරයට හා ඉන්දියානු බොල්ශෙවික් ලෙනින්වාදී පක්ෂයටයි (බීඑල්පීඅයි). එම පක්ෂය ලංකාව තුල පමනක් නොව මුලු ඉන්දු උප-මහාද්වීපය පුරාම සමාජවාදී පදනමක කම්කරු පන්තිය ඒකාබද්ධ කරන පක්ෂයක් ගොඩනැගීම මත සිය ඉදිරිදර්ශනය පදනම් කලේය. 1948 නිදහසේ කාලකන්නි සම්මුතියට විරුද්ධවූ බීඑල්පීඅයි පක්ෂය, "අල්ලසින් හා වරප්‍රසාදවලින්" කෙලෙසුනු ලාංකික ධනේශ්වරය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග අතිනත ගෙන "බොහෝ කල් ප්‍රමාදවූ ඉන්දියානු විප්ලවයට එරෙහිව අධිරාජ්‍යය සඳහා මුර කුටියක්, ආසියාතික අල්ස්ටරයක් (බ්‍රිතාන්‍ය කම්කරු අරගලයට එරෙහිව අයර්ලන්තයේ අටවන ලද රාජ්‍ය කැබලිත්ත)" බවට දිවයින පත්කරන්නේ යයි එවක දී අනතුරු ඇඟවීය.

ඉන්දියාව හා ලංකාව අතර ජාතික දේශසීමාවක් ඇඳීමේ ක්ෂනික ප්‍රතිවිපාකය වූයේ, 19 සියවසේ හා 20 වන සියවසේ දී මුල් කාලයෙහි දී ඉන්දියාවෙන් ගෙන එන ලද, ලංකාවේ ජනගහනයෙන් සියයට දහයක් පමන නියෝජනය කල, දශ ලක්ෂයක්වූ දෙමල කථාකරන වතු කම්කරුවන්ගේ තත්වය ප්‍රශ්නයට භාජනය වීමයි. පෙරලිකාරී කම්කරු පන්තියකට මුහුන දෙමින් හා සිය පාලනය තහවුරු කර ගැනීමේ මංමුලාවෙන් යුතු, අලුත් එක්සත් ජාතික පක්ෂ ආන්ඩුවේ පලමු කර්තව්‍යය වූයේ වතු කම්කරුවන්ගේ අනාගතය පිලිබඳව ඉන්දියාව සමග පැවති සාකච්ඡා කොටින්ම අත්හටුවා ඔවුන්ගේ පුරවැසි භාවය අහෝසි කිරීමයි. දෙමල ධනේශ්වරයේ කොටසක් එයට අනුමැතිය පලකල අතර, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කල මෙම සාහසික ප්‍රහාරයට විරුද්ධවූ බීඑල්පීඅයි පක්ෂය, "රාජ්‍යය ජාතිය සමගත්, ජාතිය වර්ගය සමගත් සමාන විය යුතු ය" යන වාර්ගික මූලධර්මය එජාප විසින් යොදා ගනිමින් සිටින බවට අනතුරු ඇඟවීය.

ඉන් පසුව එලඹි දශකයන්හි දී ශ්‍රී ලංකා ධනේශ්වරයේ දේශපාලන අවි ගබඩාව තුල ප්‍රබල අවියක් බවට පත්වූයේ සිංහල අධිපතිවාදයයි. දේශපාලන අර්බුදයන්ට හා සියල්ලටත් වඩා කම්කරු පන්තියේ නැගිටීම්වලට ප්‍රතිචාර වශයෙන් කොලඹ දේශපාලඥයින් වාර්ගික ආතතීන් අවුලුවමින් දෙමල ජනයාට එරෙහිව සිංහල ජනතාව පෙල ගැස්වූහ. ධනපති පාලනය එහි අත්තිවාරමට ම සොලවාලූ 1953 හර්තාලයෙන් (මහා වැඩ වර්ජනය) පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) හා එහි නායක එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බන්ඩාරනායක වාම නැඹුරුවක් සහිත සිංහල ජනතාවාදයේ න්‍යායාචාර්ය ලෙස ඉස්මතු විය. දෙමල, මුස්ලිම් සුලුතරයේ වියදමෙන් දිවයින, සිංහල බෞද්ධ රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රතිගාමී ඉදිරිදර්ශනයක් සහිතව, බ්‍රිතාන්‍ය යටත්විජිතවාදී අතීතය හෙලා දැකීමත්, සමාජවාදී කයිවාරුවත් ඔවුහු එකට මිශ්‍ර කලහ. 1956 බලයට පත්වීමෙන් පසුව බන්ඩාරනායක, දෙමල බස කථාකරන්නවුන් දෙවැනි ගනයේ පුරවැසියන්ගේ තත්වයට පිරිහෙලමින් සිංහල පමනක් රාජ්‍ය භාෂාව යන ඔහුගේ පිලිවෙත ක්‍රියාවට නැඟී ය.

## ලංකා සමසමාජ පක්ෂයේ පාවාදීම

1950 වසරේ දී ලංකා සම සමාජ පක්ෂය (ලසසප) සමග ඒකාබද්ධවූ, දුරදිග යන ඇඟවුම් සහිත බීඑල්පීඅයි හි පසුකාලීන ඉතිහාසය පිලිබඳ සමාලෝචනයකින් තොරව, ශ්‍රී ලංකාවේ පසු ඉතිහාසය වටහාගත නොහැකිය. මුලදී "සිංහල පමනක්" ප්‍රතිපත්තියට විරුද්ධවූ ලසසප නායකයෝ, එන්ට එන්ටම ශ්‍රීලනිපයේ වාම ජනතාවාදයට අනුගත වෙමින්, 1964 දී වැන්දඹු බන්ඩාරනායකගේ ධනපති ආන්ඩුවට සම්බන්ධ වූහ. සමාජවාදය සඳහා අරගලයට, පන්ති පදනමක් මත සිංහල හා දෙමල කම්කරුවන් එකමුතු කිරීමේ සටන ලසසප විසින් අතහැර දැමීම මගින්, වාර්ගික දේශපාලනය පැතිර යාමට දොර විවෘත කල අතර, කම්කරු පන්තිය තුල බරපතල ව්‍යාකූලත්වයක් නිර්මානය කලේය. ගම්බද සිංහල තරුනයන් අතර ජවිපෙ ද දෙමල තරුනයන් අතර එල්ටීටීඊය ද වැනි රැඩිකල් සුලු ධනපති ප්‍රවනතා හිස එසවීමේ කාරනය වූ , සමාජවාදයේ ජාත්‍යන්තරවාදී මූලධර්ම ලසසප විසින් පාවාදීම කරා කෙලින්ම සම්බන්ධ වෙයි.

1964 පාවාදීමේ අම්හිරි ක්‍රියාවලිය 1970-77 ශ්‍රීලනිප-ලසසප-කොප හවුල් ආන්ඩුව තුලින් මල්පල ගැන්වුනි. 1971 ජවිපෙ ආවේශයෙන් සිදුවූ තරුන නැගිටීම රුදුරු ලෙස මැඩීමෙන් පසුව ශ්‍රීලනිප, දෙමල සුලුතරයට එරෙහිව පිලිකුල් සහගත වෙනස්කම් කිරීමේ ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැගීම මගින් සිය දේශපාලන පදනම වාත්තු කර ගැනීමේ උත්සාහයක නිරත විය. ලසසප නායක කොල්වින් ආර්. ද සිල්වා විසින් සකස්කල නව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව තුලින් බෞද්ධාගම රාජ්‍ය ආගම ලෙසින් ස්ථාපිත කරන ලදී. පුද්ගලික හිමිකරුවන් සිංහල කලමනාකාරිත්වයකින් විස්ථාපනය කල වතු " ජනසතුව" මෙන්ම, වතු කම්කරුවන් බලහත්කාරයෙන් ඉන්දියාවට පටවා යැවීම ද සිල්වාගේ අධීක්ෂනය යටතේ සිදුවිය. දෙමල සිසුන්ට දැඩි අසාධාරනයක් සිදුකල විශ්ව විද්‍යාල ප්‍රවේශය "ප්‍රමිතිකරනයකට" ලක්කිරීමට ප්‍රතිචාර වශයෙන්, දෙමල තරුනයෝ පෙරලිකාරී වූහ. එහි ප්‍රතිඵලය වූයේ වෙන ම දෙමල රාජ්‍යයක් සඳහා සන්නද්ධ අරගලයේ මාවත ගත් එල්ටීටීඊ වැනි කන්ඩායම් ගොඩනැගී ඒමයි.

1975-76 වසරවල ගෝලීය ආර්ථික පසුබෑම හමුවේ, "සමාජවාදය" ලෙස වෙස් ගැන්වූ බන්ඩාරනායක ආන්ඩුවේ ජාතිකවාදී පරිපාලනයේ ආර්ථික පිලිවෙත් තුලින් නිර්මානය කල ව්‍යසනය, 1977 මැතිවරනයෙන් අති විශාල ජයග්‍රහනයක් අත් කර ගැනීම සඳහා එජාපය විසින් ගසා කෑවේය. ලෝකයේ ප්‍රථම වතාවට නිදහස් වෙලඳපොල ප්‍රතිපත්ති ක්‍රියාවට නැගූ එක් තැනක් වූ ජේ.ආර්. ජයවර්ධනගේ ආන්ඩුව, එමඟින් දිවයින, විදේශ ප්‍රාග්ධනය සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පත් කිරීමට උත්සාහ කලේය. රාජ්‍ය අංශයේ රැකියා, සේවා හා ජීවන කොන්දේසි කරා ගැඹුරින්ම කාවැදුනු ඔහුගේ ප්‍රතිපත්ති, 1980 මහා වැඩ වර්ජනයකින් කුලුගැන්වුනු කම්කරු පන්තියේ විරෝධතාවන් අවුලුවා ලීය. නොකඩවා පැවති සමාජ අසහනය හා ගෝලීය ආර්ථික පසුබෑම හමුවේ ජයවර්ධන, ඒවන විටත් උරගා බලා හා අත්හදා බලා තිබුනු, වාර්ගික දේශපාලනය කරා යොමු විය. දෙමල විරෝධී මර්දනය, ප්‍රකෝපකරනය හා ජයවර්ධනට මුලු වැර යොදා යුද්ධය දියත් කිරීමට වේදිකාව සකස් කල, 1983 දිවයින පුරා සිදුවූ බිහිසුනු ප්‍රචන්ඩ ක්‍රියා සඳහා නිමිත්ත ලෙස යොදා ගත්තේ, දෙමල බෙදුම්වාදීන්ගේ හුදකලා සන්නද්ධ ප්‍රහාර ය.

එතැන් සිට එලඹි 25 වසර පුරා ධනපති පන්තිය, ප්‍රධාන ප්‍රතිපත්ති දෙකක් කරා යොමු විය. ඒ, ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස දිවයින ගෝලීය ධනවාදය තුලට මුලුමනින්ම ඒකාග්‍ර කිරීම හා යුද්ධයයි. මේ තත්වය සෑම ආන්ඩුවකට ම උභතෝකෝටිකයක්ව තිබුනි. ගැටුම ආර්ථික සංවර්ධනයට බාධකයක් බවට පත්ව තිබුනු අතර, එය අවසන් කිරීමට දරන ලද ඕනෑම ප්‍රයත්නයකට එරෙහිව, ධනේශ්වර පාලනයේ ප්‍රධාන ම මුක්කුව බවට පත්ව තිබූ, සිංහල අධිපතිවාදය පිහිටා සිටියේය. සියවස් කාලක් පුරා දිවෙන වාර්ගික ගැටුම, මිලිටරිය ද රාජ්‍ය නිලධරය ද බෞද්ධ සංස්ථාපිතය ද ව්‍යාපාරිකයේ කොටස් ද තුල විශේෂ ලාභ ප්‍රයෝජන උපයා ගැනීමේ බලගතු බැඳීම් නිර්මානය කල අතර, එල්ටීටීඊය සමග සම්මුතියක් සඳහා උත්සාහ දැරූ සෑම ආන්ඩුවකට ම එම කොටස්වල දැඩි විරෝධයට මුහුන පෑමට සිදු විය.

සය දශකයකට පසු යමෙකුට, සිංහල ජනතාවාදයේ, එහි වඩාත්ම රැඩිකල් රූපාකාරයේ පවා, ප්‍රතිගාමී තර්කනය පිලිබඳව කිසිදු සැකයක් තිබිය නොහැකිය. ජවිපෙ, 1960 ගනන්වල දී මාවෝසේතුං හා චේ ගුවේරා වර්ගයේ "සන්නද්ධ අරගලයේ" මාවත ගෙන තිබුනු නමුදු 1980 ගනන් අග භාගයේ දී වාර්ගික යුද්ධයේ අතිශය උද්යෝගිමත් මාර්ගෝපදේශකයන් බවට පත් විය. ඔවුහු 1987 ඉන්දු ලංකා ගිවිසුම තුලින් ගැටුමට විසඳුමක් සෙවීමට ජයවර්ධන ගත් උත්සාහයට, කටුක විරෝධයක් දැක්වූහ. එහි නියෝග පිලිපැදීම හා එම ව්‍යාපාරයට සහාය දැක්වීම ප්‍රතික්ෂේප කල සිය ගනන් කම්කරුවන්, වෘත්තීය සමිති සටන්කරුවන් හා දේශපාලන විරුද්ධවාදීන්, ජවිපෙ සන්නද්ධ කල්ලි විසින් ඝාතනය කිරීමත් සමඟ, කම්කරු පන්තිය කෙරෙහි එහි ආවේනික සතුරුකම ප්‍රසිද්ධියේ ම හෙලිදරව් විය. 1990 ගනන්වල දී ජවිපෙහි හිටපු ගරිල්ලෝ, කොලඹ දේශපාලන සංස්ථාපිතයේ හවුල්කරුවන් බවට පත්වෙමින්, 2004-05 වසරවල ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් ආන්ඩුවට ද ඇතුල්වූ අතර, ආන්ඩුවේ නිදහස් වෙලඳපොල න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට සහයෝගය දුන්හ. දැන් නාමිකව විරුද්ධ පක්ෂයේ වාඩිවී සිටිය ද ජවිපෙ, රාජපක්ෂගේ යුද්ධයට පිටුබලය දෙමින් ද එහි මිලිටරි අයවැයට හා හදිසි නීති පාලනයට ඡන්දය දෙමින් ද රාජපක්ෂගේ ආන්ඩුවට අභියෝගයක් වන ඕනෑම වෘත්තීය සමිති අරගලයක් කඩාකප්පල් කිරීම සඳහා යලි යලිත් මැදිහත් වෙමින් ද සිටිති.

## දෙමල බෙදුම්වාදය

දෙමල ජනතාව සම්බන්ධයෙන් ගත්කල, දෙමල බෙදුම්වාදයේ රූපය ගත් වර්ගවාදය ද මාරක දේශපාලන උගුලක් බව සනාථවී තිබේ. එල්ටීටීඊයේ හිටපු දේශපාලන ප්‍රකාශක ඇන්ටන් බාලසිංහම් සදොස් ලෙස ප්‍රකාශ කලේ "ස්වයං නීර්න අයිතිය" මාක්ස්වාදය විසින් පූජනීයත්වයට පත් කල අනුල්ලංඝනීය මූලධර්මයක් වූ බවයි. කෙසේ වුව ද වෙනම දෙමල රාජ්‍යයක් සඳහා කැඳවුමෙහි කිසිදු නෛසර්ගික ප්‍රගතිශීලී බවක් ඇත්තේ නැත. සිය සිංහල හවුල්කරුවන්ගේ ද්වීතියික භූමිකාව ඉටුකිරීමට බලකෙරී තිබුනු දෙමල ප්‍රභූ පැලැන්තියේ අපේක්ෂා භංගය පිලිබිඹු කරමින්, ස්වාධීන ඊලමක් පිලිබඳ ඉල්ලීම ප්‍රථම වතාවට ඉදිරිපත් කරනු ලැබුවේ, 1970 ගනන්වල ධනේශ්වර දෙමල එක්සත් විමුක්ති පෙරමුන (ටීයූඑල්එෆ්) විසින් ය. බන්ඩාරනායකලාගේ දෙමල විරෝධී නොපනත්කම් උත්සන්න කිරීම කෙරෙහි දෙමල ධනේශ්වරය ප්‍රතිචාර දැක්වූයේ, තමන්ගේ ම කම්කරු පන්තිය සූරාකෑම සඳහා තමන්ගේ ම ධනේශ්වර රාජ්‍යයක් ගොඩනැගීම සඳහා කැඳවුම් කිරීමෙනි.

ලසසප පාවාදීම මඟින් කොලඹ තන්ත්‍රයට එරෙහිව, සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම්ව, සියලු කම්කරුවන් පොදු අරගලයක් තුල එකාබද්ධ කිරීමේ ස්වාධීන විකල්පයක් විස්තාරනය කිරීමෙන්, කම්කරු පන්තිය වලක්වා ලීය. ලසසපය බන්ඩාරනායක ආන්ඩුව තුල ලැග සිටීම, එල්ටීටීඊය පිහිටුවීමට මුල්වූ දෙමල තරුනයන් විසින් අල්ලා ගත්තේ, මාක්ස්වාදය හා ට්‍රොට්ස්කිවාදය අසාර්ථක වී ඇති බව පෙන්වන නිදසුන් ලෙසය. එල්ටීටීඊය ඇතැම් විට සමාජවාදය පිලිබඳව සඳහන් කල ද එහි ක්‍රියාමාර්ගය සැබවින්ම ධනේශ්වර ටීයූඑල්එෆ් වැඩ පිලිවෙලම විය. ටීයූඑල්එෆ් සමඟ එයට පැවති මතභේද, තනිකර ම උපායාත්මක ඒවා විය. ටීයූඑල්එෆ් හි අසාර්ථක පාර්ලිමේන්තුවාදී උපාමාරු

කෙරෙහි කලකිරුනු එල්ටීටීඊය වෙනම රාජ්‍යයක් සඳහා සටන් කිරීම සඳහා ආයුධ අතට ගත්තේය.

මිලිටරිමය වශයෙන් එල්ටීටීඊයේ බිඳ වැටීම, එහි පන්ති දිශානතියේ හා දේශපාලන ඉදිරිදර්ශනයේ නිමැවුමකි. සන්නද්ධ අරගලය පිලිබඳ එහි විශ්වාසය පිටුපස පැවතියේ කම්කරු පන්තියේ දේශපාලන විඥ්ඥානය වර්ධනය කිරීම හා සමාජවාදී පදනමක් මත එහි ස්වාධීන බල මුලු ගැන්වීම කෙරෙහි ඔවුන් තුල ගැඹුරින්ම මුල් බැස තිබුනු සතුරු කමයි. එල්ටීටීඊ සටන්කරුවන්, ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන් හා දේශපාලඥයන් පමනක් නොව, හිතාමතාම වාර්ගික වෛරය ගිනි අවුලුවමින් හා ආන්ඩුවේ ප්‍රචාරක යාන්ත්‍රනයට තෙල් ඉසිමින්, සාමාන්‍ය සිංහල කම්කරුවන් හා ගම්වාසීන් ද සිය ප්‍රහාරයන්ට ඉලක්ක කොට ගත්හ. සිය දේශපාලන විරුද්ධවාදීන් මැඩීම හා මරාදැමීම මගින්, දෙමල ජනතාවගේ එකම නියෝජිතයා තමන්ය යන ඔවුන්ගේ කියාපෑම නිර්දය ලෙස බලගැන්වීමට ඔවුහු ක්‍රියා කලහ. තම පාලනය යටතේ ඇති ප්‍රදේශ තුල ජනතා අතෘප්තිය පාගා දැමීමේ ද අසාධාරන බදු පැනවීමේ ද තරුනයන් බලහත්කාරයෙන් බඳවා ගැනීමේ ද සෑම සංවිධානයක්ම සිය අනසකට යටත් කිරීමේ ද ප්‍රජාතන්ත්‍ර විරෝධී තන්ත්‍රයක් ඇටවීම මගින්, එල්ටීටීඊය ප්‍රදර්ශනය කර ඇත්තේ, ජනතාව කෙරෙහි පවත්නා එහි සතුරුකමයි. එවන් පියවර මගින් ජනනය කලේ දේශපාලන ගෞරවය හා පක්ෂපාතිත්වය නොව නොසතුට, බිය හා විරුද්ධත්වයයි.

එහි සටන්කාමී මැත දෙඩවිලි තිබිය දී ම, වෙන ම රාජ්‍යයක් සඳහා වූ එල්ටීටීඊ සැලසුම් අවසාන විග්‍රයේ දී පදනම්ව ඇත්තේ, නොයෙකුත් ප්‍රධාන හා අප්‍රධාන බලවතුන්ගේ ජාත්‍යන්තර පිටුබලය දිනාගැනීම මතය. කලින් කලට, එක් හෝ තවත් බලවතෙකු සමග ගෙනගිය එල්ටීටීඊ තත්කාර්යවාදී උපාමාරු දැමීම් කෙලවර වූයේ ව්‍යසනයකිනි. ඉන්දීය සහයෝගය මත සියල්ල පරදුවට තබමින්, 1987 ඉන්දු ලංකා ගිවිසුම යටතේ උතුරට ඉන්දීය හමුදා ගොඩ බැස්සවීම එල්ටීටීඊය පිලිගත් අතර, නව දිල්ලියේ හා තමන්ගේ අභිලාෂයන් එකට සම්පාත නොවන බව සොයා ගත්තේ අනතුරුවය. ඉන්දියානු හමුදාව එහි සටන්කරුවන් නිරායුධ කිරීමට උත්සාහ කිරීමත් සමග සටන් ඇවිලී යාම තුලින් නොමනාපයට පත් එල්ටීටීඊය, පෙරලා පහර දෙමින්, 1991 දී ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි ඝාතනය කිරීම, ජාත්‍යන්තර කරලියෙහි එහි තත්වය තව දුරටත් දුබල කල පියවරක් විය

සීතල යුද්ධයේ අවසානයෙන් පසුව ජාත්‍යන්තර සම්බන්ධතාවන්හි සිදුවූ වේගවත් මාරුව එල්ටීටීඊය අන්දුන් කුන්දුන් කලේය. මැද පෙරදිග පලස්තීන විමුක්ති සංවිධානයත්, දකුනු අප්‍රිකාවේ අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයත් මෙන්ම එල්ටීටීඊය ද ඊට ප්‍රතිචාර දැක්වූයේ, නිදහස් වෙලඳපොල දෘෂ්ටිවාදය ප්‍රසිද්ධියේ ම වැලඳගැනීම හා අධිරාජ්‍යවාදය සමඟ සහවාසයක් ඇති කර ගැනීමේ උත්සාහයක් මගින් ය. 2001 සැප්තැම්බර් 11 ඉක්බිත්තෙහි, 2002 වසරේ සටන් විරාමයකට එලඹෙමින් ද ස්වාධීන ඊලමක් සඳහා වූ සිය ඉල්ලීම අතහරිමින් ද බලය බෙදාගැනීමේ වැඩ පිලිවෙලක් සඳහා සාකච්ඡාවලට පිවිසෙමින් ද එල්ටීටීඊය, බුෂ් පරිපාලනයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ඉලක්කයක් බවට පත්වීමෙන් වැලකී සිටීම සඳහා මංමුලා සහගත උපාමාරුවල නිරත විය. ශ්‍රී ලංකාවේ දේශපාලනය තුල එල්ටීටීඊයට කුඩා භූමිකාවකට වඩා කිසිවක් පවරා දීම කෙරෙහි එක්සත් ජනපදය හා ඉන්දියාව තුල උනන්දුවක් ඇත්තේ නැතැයි පැහැදිලි වීමත් සමග, සාම සාකච්ඡා ඉක්මනින්ම බිඳ වැටුනි.

2006 වසරේදී රාජපක්ෂ ආන්ඩුව දිවයින යලි යුද්ධයට ඇද දමමින්, 2002 සටන් විරාමය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සාහසික ලෙස උල්ලංඝනය කල අවස්ථාවේ, සමස්ත "ජාත්‍යන්තර ප්‍රජාව" ක්‍රියාකලේ එය නොදුටු පරිද්දෙන්ය. යලි ඇරඹූ යුද්ධයට, මිලිටරි හා දේශපාලන සහාය ද එල්ටීටීඊය තහනම් කිරීම සඳහා යුරෝපා සංගමයට හා කැනඩාවට බලකෙරෙන රාජ්‍යතාන්ත්‍රික වාතාවරනය ද සපයා දෙමින් එක්සත් ජනපදය ඊට පිටුබලය දුන්නේය. ශ්‍රී ලංකා මිලිටරියට අවශ්‍ය ආයුධවලින් වැඩි කොටස ඇමරිකානු සගයන් වන ඊස්රායලය හා පකිස්ථානය විසින් සපයන ලදී. තමන්ගේ ම රටෙහි දෙමල ජනගහනය අතර කැලඹීම් ඇතිවීමේ හැකියාව පිලිබඳ නොසංසුන්කම මධ්‍යයේ ම ඉන්දියාව, සිය එදිරිවාදීන් වන පකිස්ථානය හා චීනය පිටුදැකීමේ අරමුනෙන් ශ්‍රී ලංකා ආන්ඩුවට දේශපාලන හා මිලිටරි පිටුබලය සැපයීය. කිසිදු ප්‍රශ්නකිරීමකින් තොරව බීජිනය මුදල් හා ආයුධ සැපයීය.

ජාත්‍යන්තරව හුදකලා වූ එල්ටීටීඊය, සංඛ්‍යාවෙන් හා අවි බලයෙන් බෙහෙවින් ශක්තිමත් කරන ලද ශ්‍රී ලංකා හමුදාවට මුහුන දුන්නේය. සිය භූමියෙහි දී, එල්ටීටීඊයේ දේශපාලන පදනම, 2002 සටන් විරාමයෙන් ජීවන තත්වයන්ගේ සැලකිය යුතු ප්‍රගතියක් ඇති නොවීම හා එහි ම මර්දනකාරී ක්‍රමෝපායන් හේතු කොට බෙහෙවින් ඛාදනයට ලක්විය. ප්‍රතිවාදී කන්ඩායම් තම තමන්ගේ සහයෝගිතා පදනම් පුම්බා ගැනීමට උත්සාහ දරන අතරතුර 2004 දී, කරුනාගේ මූලිකත්වයෙන් යුත් නැගෙනහිර පලාතේ නායකයන්, උතුරේ තම හවුල්කරුවන් පාලනයේ වාසි තමන්ට පමනක් බෙදාගන්නා බවට චෝදනා නගමින් කැඩීගියේ, එය දුබල කරන බෙදීමක් නිර්මානය කරමිනි. මෙම විභේදනය, කරුනාගේ සන්නද්ධ කල්ලිවල ද සහාය ඇතිව, 2007 මැද භාගය වන විට එල්ටීටීඊය

නැගෙනහිරෙන් පලවා හැර, තම සියලු සම්පත් උතුරට යෙදවීමෙහි ලා හමුදාවට හැකියාව ලබාදුන් වැදගත් සාධකයක් විය.

ශ්‍රී ලංකාවේ ද ලොව පුරා ද සිටින දෙමල කම්කරුවන්, තරුනයන් හා බුද්ධිමතුන් අතර, හමුදාව අතින් එල්ටීටීඊය පරාජය වීමෙන් පසුව මර්දනයේ හා පීඩාවේ නව රැල්ලක් හටගනිතැයි යන සාධාරන බියක් පවතියි. කෙසේ වුව ද දෙමල බෙදුම්වාදයේ ඉදිරිදර්ශනය බදාගෙන සිටීමෙන් දෙමල කම්කරුවන්ට හෝ තරුනයන්ට තමන්ගේ  ආරක්ෂාව සලසාගත හැකි නොවේ. ඔවුන් වාර්ගික දේශපාලනයෙන් තීරනාත්මකව බිඳී වෙන්විය යුතුය. ඔවුන් දැන් හැරීගත යුත්තේ, තමන් හා සමානව ම ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට හා ජීවන කොන්දේසි මත එල්ල කෙරෙන ගැඹුරුවන ප්‍රහාරයන්ට මුහුනපා සිටින, දිවයින තුල ද දකුනු ආසියාවේ හා ජාත්‍යන්තර පන්ති සහෝදර සහෝදරියන් වෙතය. සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත එක්සත් වීම මගින් පමනක් කම්කරු පන්තියට, පීඩිත ජනතාවන් තමන් පිටුපසින් මෙහෙයවා ගෙන සමාජ අසමානතාවයේ, වර්ගවාදයේ හා යුද්ධයේ සැබෑ මූලය වන ලාභ පද්ධතියට ම එරෙහිව ප්‍රහාරයක් දියත් කල හැකි වනු ඇත.

මෙම ඉදිරිදර්ශනය සඳහා ශ්‍රී ලංකාව තුලත් උප-මහාද්වීපය තුලත් සටන් වදින එකම සංවිධානය සමාජවාදී සමානතා පක්ෂය පමනි. ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා විප්ලවවාදි අරගලය ගෙනයා හැක්කේ දකුනු ආසියාවේ ද ලොව පුරා ද සමාජවාදය සඳහා සටනක අත්‍යන්ත කොටසක් ලෙස පමනකි. ශ්‍රී ලංකාව, උප මහාද්වීපය පුරා ඉදිරියට ඇදෙමින් තිබෙන දේශපාලන සන්තතීන්හි තීව්‍ර නිරූපනයකි. නිදහසෙන් පසුව ගතවූ හැට වසර තුල, දකුනු ආසියානු රටවල ජනගහනයෙන් අති මහත් බහුතරය ආර්ථික පසුගාමිත්වයේ හා දරිද්‍රතාවයේ ගැලී සිටිති. කලාපය යුද්ධයන්ගෙන් හා පුපුරා යන වාර්ගික ප්‍රචන්ඩත්වයන්ගෙන් කැලඹීමට පත්ව ඇති අතර ඒවායේ මුල් 1947 ප්‍රතිගාමී බෙදීමෙන් මතුකල නොවිසඳුනු ප්‍රශ්න කරා විහිද පවතියි. පාලක ප්‍රභූ කොටස් නිදහස් වෙලඳපොල න්‍යායපත්‍රය වැලඳගැනීමත් සමග සමාජ විභේදනය ගැඹුරුවී තිබේ. පාලකයන් යලි යලිත් වාර්ගික දේශපාලනය කරපින්නා ගන්නේ එබැවිනි. දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී රාජ්‍යයන් පිලිබඳ ඉදිරිදර්ශනය දැවෙන හා ප්‍රායෝගික අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.

එක්සත් ජනපදයේ නායකත්වයෙන් සිදු කල ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය හා නව යටත්විජිතකරනයට විරුද්ධවීමෙහි ලා කලාපයේ පාලක ප්‍රභූවන් දැක්වූ නොසමත්කම විසින් මතු කෙරුනු තියුනු ම අනතුරු ඇඟවීම ග්‍රහනය කර ගැනීම අවශ්‍යය. ගෝලීය ආර්ථික අර්බුදය, මහා බලවතුන් අතර ආතතීන් උත්සන්න කරමින් ඔවුන් අතර ආර්ථික හා මූලෝපායික එදිරිවාදිකම් තියුනු කරයි. විශාල ලාභ ශ්‍රම තටාකයන් සහිත ඉන්දියානු උප මහාද්වීපය, මෙම අධිරාජ්‍යවාදී කුමන්ත්‍රන ජාලය තුලට ඇදී යමින් ඇත්තේ, කම්කරු පන්තියට විනාශකාරී ප්‍රතිවිපාකයන් ගෙන එමිනි. පසුගිය ගෝලීය ගිනි මැලය තුලදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය එහි දේශීය දේශපාලන නියෝජිතයන්ගේ ද ස්ටැලින්වාදී ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ ද සහාය ඇතිව ලක්ෂ ගනනක් ඉන්දියානුවන් යුද්ධයට බිලිදීම සඳහා බලහත්කාරයෙන් හමුදාවට බඳවාගත්හ. ඉන්දීය, පකිස්ථාන, ශ්‍රී ලංකා හා බංග්ලාදේශ ආන්ඩු ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද යුද්ධයට සහාය දීම, යලි වතාවක් මෙම ධනේශ්වරය අධිරාජ්‍යවාදී ගැටුම්වලට කම්කරු පන්තිය බිලිදීම සඳහා සැදී පැහැදී සිටින බවට නොවරදින සලකුනකි.

සමාජවාදී සමානතා පක්ෂය, 1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ලෙස පිහිටවූ තැන් පටන් ම, සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම වෙනුවෙන් සටන් වැදී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එය රාජ්‍ය සංස්ථාපිතයේ මෙන්ම ජවිපෙ හා එල්ටීටීඊයේ හිංසනයට ගොදුරු වී තිබේ. පක්ෂයට කෙලින් සිටගත හැකිව ඇත්තේ එය පිහිටුවන ලද්දේ බලගතු අත්තිවාරම් මත වීම නිසාම ය. එනම්, සියලු වර්ගයේ ජාතිකවාදයන්ට හා අවස්ථාවාදයන්ට එරෙහිව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමඟ ඒකාබද්ධව මාක්ස්වාදය සඳහා ගෙනගිය අරගලය මත එය තිරසරව පිහිටාගැනීම නිසාය.

කලාපයේ හා ලෝකය පුරා බලගතු සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමේ පලමු පියවර වශයෙන්, ශ්‍රී ලංකා ආන්ඩුවේ ප්‍රතිගාමී යුද්ධයටත්, සියලු වර්ගයේ ජාතිකවාදයන්ට, වාර්ගික නොපනත්කම් හා වර්ගවාදයටත්, විරුද්ධ වන ලෙස සසප දකුනු ආසියාවේ සකල කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටියි. අපගේ පාඨකයන්ගෙන් අප උදක්ම ඉල්ලා සිටින්නේ, දෛනික පදනමකින් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ විස්තාරනය කරන ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය බැරෑරුම්ව හදාරන ලෙසත් සසප හා ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීමට එකතුවන ලෙසත් ය.

© www.wsws.org